


(https://online.mobitel.lk/onlinepay/)



# 20 වන ව්‍යවස්ථා සංශෝධනය සම්මත කිරීමට පෙර

පළකරන ලද්දේ: September 22 2020
Views 250



වත්මන් ආණ්ඩුවට ජනාධිපතිවරණයේදීද පාර්ලිමේන්තු මැතිවරණයේදීද පැහැදිලි ජනවරමක් හිමිව තිබෙන අතර 19 වන ව්‍යවස්ථාව සංශෝධනය අහෝසි කිරීමද ඔවුන්ගේ මැතිවරණ ව්‍යාපාරය තුළ ප්‍රධාන මාතෘකාවක් විය. ඒ අර්ථයෙන් 19 වන ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කිරීම හෝ සංශෝධනය කිරීම ජනවරමට අනුව යාමකි. එය කිසිවෙකුටත් අභියෝග කළ හැකි යැයි නොසිතමු. එහෙත් ජනතාව ඡුන්දය භාවිත කළේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය ඉලක්ක කරගෙනද වෙනත් දේශපාලන ප්‍රතිපත්ති හෝ සංවර්ධන කරුණු සැලකිල්ලට ගෙනද යන්න ආණ්ඩුව කල්පනා කළයුතුව ඇත. ඒ අනුව ආණ්ඩුවේ ප්‍රමුඛතා ලේඛනය ඉතා ප්‍රවේශමෙන් තෝරා බේරා ගත යුතුව ඇත. එමෙන්ම 19 ව්‍යවස්ථාව සංශෝධනය කර ගෙන එන ඕනෑම සංශෝධනයකට ජනවරම ලබාදී නොමැති බවද තේරුම් නොගෙන සංශෝධන ගෙන එනු ලැබුවහොත් ජනතා අප්‍රසාදයට පත්වීම වැළැක්විය නොහැකි වනු ඇත.

ඒ අනුව 20 ව්‍යවස්ථා සංශෝධනය සිදුකිරීමේදී ඉතා ප්‍රවේශමෙන් ජනතා අභිලාශය අනුව හා ප්‍රමුඛතා වටහාගෙන තීරණ ගතයුතුව ඇත. නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදී පාලන රටාවක් ක්‍රියාත්මක ලංකාවේ සංවරණ හා තුලන ක්‍රමය නොසලකා ව්‍යවස්ථා සංශෝධනය සිදුකළ සෑම අවස්ථාවකම එකී ආණ්ඩු මහජන අප්‍රසාදයට ලක්වූ අතර රට තුළ අර්බුධකාරී තත්ත්වයන්ද නිර්මාණය විය. 1978 ව්‍යවස්ථාව මීට හොඳම උදාහරණයක් ලෙස දැක්විය හැක.

එමෙන්ම දේශපාලන කඳවුරු තුළ සිරවී කරනු ලැබූ සෑම ව්‍යවස්ථා සංශෝධනයකදීම එම රටවල් අර්බුදයකට යොමුකර ඇත. ඒ පිළිබඳව දේශීය හා විදේශීය අත්දැකීම් අප සතුව ඕනෑ තරම් ඇත. ආණ්ඩු බලය හුවමාරුවීම නිසා හෝ ඒ මොහොතේ ඇතිවන දේශපාලන තත්ත්වය පාලනය කිරීමට හෝ පුද්ගල සාධක මත පමණක් පදනම්ව ව්‍යවස්ථා සංශෝධනය කිරීමට පෙළඹීම, එකී ව්‍යවස්ථාදායකයට හා රටේ ජනතාව කරන අගෞරවයකි.

නව ආණ්ඩුවක් බලයට පත් වීමෙන් පසු ඔවුන්, ජනතාව ඉදිරියේ ලබාදුන් පොරොන්දු පත්‍ර ඒ ආකාරයෙන්ම ඉෂ්ට කිරීම ඔවුන්ගේ වගකීමක් වන බැවින්, ඒ සඳහා පවතින බාධා ඉවත්කරගැනීම හෝ කළමනාකරණය කර ගැනීමට ඔවුනට ඉඩකඩ තිබිය යුතුය. එහෙත් එහිදී මූලික ප්‍රජාතන්ත්‍රවාදී පාලන මූලධර්ම නොසලකා කටයුතු නොකිරීමට වග බලාගත යුතුය.

20 වන ව්‍යවස්ථා සංශෝධනයේදී 19 වන ව්‍යවස්ථාවේ අඩංගු ප්‍රධාන කරුණු තුනක් ඉදිරියට ගෙන යෑමට ව්‍යවස්ථා කෙටුම්පත් කළ පිරිස ක්‍රියාකර තිබේ. ඒ අනුව තොරතුරු දැන ගැනීම් අයිතිය  පිළිගන්නට හා සුරක්ෂිත කරන්නට ක්‍රියා කිරීම අගය කළ යුත්තකි. එහෙත් එහිදී තොරතුරු කොමිසම පත්වන ආකාරය පිළිබඳව පැහැදිලි කරගත යුතුව ඇත. එමෙන්ම පාර්ලිමේන්තුවේ හා ජනාධිපති ධුරයේ වසර 5 ක කාලය වෙනස් නොකර තබාගැනීමටත්, ජනාධිපතිවරයාට ධුරය දැරීම දෙවතාවකට සීමා කිරීම, එලෙසම තබාගැනීමත් අගය කළ යුතුය.

එහෙත් 20 වන ව්‍යවස්ථා කෙටුම්පත් සම්මත කිරීමට පෙර පහත සඳහන් කරුණු කෙරෙහි ව්‍යවස්ථා දායකයෝ (ව්‍යවස්ථාදායක නියෝජිතයන්ගේ* අවධානය යොමුකරනු කැමැත්තෙමු.

1. මැතිවරණ කොමිෂන් සභාවේ බලතල අඩු කිරීම - ස්වාධීනභාවය අභියෝගයට ලක්වීම.

කලින් කල විවිධ චෝදනා එල්ල වුවද මැතිවරණ දෙපාර්තමේන්තුව පැවැති කාලයේත් මැතිවරණ කොමිෂන් සභාව බවට පත් වූ පසුවත් යම් ස්වාධීනභාවයක් ආරක්ෂා කර ගනිමින් මැතිවරණ ක්‍රියාවලිය මෙහෙයවීමට ඔවුන් සමත් විය. පාලකයා කවුරුන් වුවත් ජනතාවගේ කැමැත්ත මැතිවරණ හරහා ප්‍රකාශ විය. එය සියයකට සීයක්ම සාධාරණ සමබිමක් තුළ නොවූවද මැතිවරණ දෙපාර්තමේන්තුව/කොමිසම හා එහි නිලධාරීන් ජනමතයට සාධාරණයක් කළ බව අපගේ විශ්වාසයයි.

20 වන ව්‍යවස්ථා සංශෝධන කෙටුම්පත හරහා කොමිෂන් සභා සාමාජිකයන් පත්කිරීම දේශපාලන අධිකාරියට පවරා ඇත. තම පත්වීම සිදුකළ බලධාරියා තරගකරුවෙකු වන විට එම තරගය සාධාරණව පවත්වා විනිශ්චයක් ලබාදීමට ඔවුන් කෙතරම් සමත්වනු ඇත්ද?, එමෙන්ම මැතිවරණ පිළිබඳව අත්දැකීම් ඇති නියෝජ්‍ය හෝ ඊට ඉහළ අත්දැකීම් ඇති නිලධාරියෙකු කොමිසමට ඇතුළත් කිරීමේ අනිවාර්ය සාධකය ඉවත්කර ඇත. ඒ අනුව මැතිවරණ පිළිබඳ කිසිදු ප්‍රායෝගික දැනුමක් නොමැති තිදෙනකු වුවද පත්විය හැකිය. දිගින් දිගටම කොමිෂන් සභාවේ සනපූර්ණය පිළිබඳ මතු කළ ගැටලුව කෙරෙහි අවධානය යොමුකර නැත. මෙහි බරපතළම කරුණ වනුයේ මැතිවරණයකදී රාජ්‍ය බලය, දේපළ අවභාවිතය වැළැක්වීමට තිබූ අයිතිය අහිමි කිරීමයි. ඒ අනුව මැතිවරණ කාලය තුළ දේශපාලන අරමුණු සහිතව සිදුකරන පත්කිරීම්, මාරු කිරීම්, උසස් කිරීම් හෝ සංවර්ධන ව්‍යාපෘති පාලනය කිරීමට කොමිසමට තිබූ බලය අහිමි වී ඇත. ඊට අමතරව මැතිවරණ කාල සීමාව තුළ කැබිනට් නොවන සියලු අමාත්‍යවරුන්ටද පෙර පරිදිම ක්‍රියා කිරීමට ඉඩ සැලසීම, රාජ්‍ය දේපළ මැතිවරණ සඳහා භාවිත කිරීමට නීත්‍යනුකූල ඉඩ ලබාදීමක් විය හැකිය.

2. රාජ්‍ය සමාගම් විගණනයෙන් ඉවත් කිරීම.

20 වන ව්‍යවස්ථා සංශෝධනයට බරපතළ විවේචනයක් එල්ල වන ප්‍රධාන කරුණක් වනුයේ රාජ්‍ය මුදල් බිලියන ගණනක් වාර්ෂිකව හුවමාරු වන, ලිට්රෝ ගෑස් සමාගම, ශ්‍රී ලංකන් ගුවන් සමාගම හා විදුලි සමාගම් වැනි රාජ්‍ය සමාගම් සියයකට වැඩි ප්‍රමාණයක් විගණකාධිපතිවරයාගේ විගණනයෙන් ඉවත් කිරීමයි, එවැනි සමාගම් කිහිපයක් පිළිබඳව පසුගිය කාලය පුරාවට ආන්දෝලනාත්මක සංවාද රට තුළ නිර්මාණය විය. 19 ව්‍යවස්ථාව සංශෝධනයේ ප්‍රතිපාදන මත මෙම සමාගම්වල අක්‍රමිකතා හඳුනාගැනීමට පසුගිය කාලය තුළ අවස්ථාවක් උදාවිය. එබැවින් එම ඉඩප්‍රස්ථා ඇහිරීම ¥ෂණයට නීත්‍යනුකූල ඉඩක් ලබාදීමක් විය හැක. එමෙන්ම ජනාධිපති ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ කාර්යාලය හා අමාත්‍යවරුන්ගේ කාර්යාල විගණනයෙන් ඉවත්කිරීම මහජන අප්‍රසාදයට හේතුවන්නකි. මෙවැනි කරුණු කිසිසේත්ම සාධාරණීකරනය කළහැකි හෝ හෘද සාක්ෂියක් ඇති කිසිවෙකුට අනුමත කළහැකි හෝ කරුණු නොවේ. 20 සම්මත කිරීමට ප්‍රථම මේ පිළිබඳව කෙටුම්පත් සම්පාදකයින් හා ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන් ගැඹුරින් කල්පනා කළ යුතුය.

ඉදිරි කාලය තුළ රජය විශාල සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේ නම් ආණ්ඩුවේ තීන්දු ගන්නා පිරිසගේ රූකවරණය තහවුරු කිරීමට තිබිය යුතුම ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව අහෝසි කිරීම හා විගණන සේවා කොමිෂන් සභාව අහෝසි කිරීම කෙටුම්පත් සම්පාදකයන් සාධාරණීකරනය කරන්නේ කෙසේද යන්න රටට කිව යුතුය. මෙම සංශෝධනය හරහා රාජ්‍ය මූල්‍ය පාලනයට/අධීක්ෂණයට ව්‍යවස්ථාදායකයට ඇති අනුලංඝනීය අයිතියද අභියෝගයට

ලක් වී ඇත. එපමණක්ද නොව ජනාධිපතිවරයාට අදාළ රාජ්‍ය සමාගම් පිළිබඳව තොරතුරු දැනගැනීමට ඇති නිල ලේඛනය වනුයේ විගණකාධිපති වාර්තාවයි.

3. විදේශ රටක පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකික පුරවැසියෙකුට, ජනාධිපති හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වීමට ඉඩකඩ ලබාදීම.

විදේශ රටවල අත්දැකීම් සහිත පුද්ගලයෙකුගේ දැනුම ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක කරගැනීම, ගැටලුවක් නොවන නමුදු රාජ්‍ය නායකයා ලෙස හෝ ව්‍යවස්ථාදායකයේ සභිකයෙකු ලෙස විදේශ පුරවැසිභාවය සහිත කෙනෙකු තෝරාපත් කරගැනීම, රටටත් එහි ජනතාවටත් කරන නිගරුවකි. අභිමානවත් ජාතියක් ලෙස ශ්‍රී ලාංකිකයෙකු රාජ්‍ය නායකයා ලෙස තෝරාගැනීමට අප අසමත් නම් විදේශ පුරවැසිභාවය සහිත කෙනෙකු මත රඳාපැවැතීමට සිදුවන්නේ නම් අපගේ අභිමානයට කුමක් වනු ඇත්ද? එමෙන්ම ශ්‍රී ලංකාව පිළිබඳව ගෞරවයක්, අභිමානයක් හෝ ජනතාවට සේවය කිරීම ප්‍රමුඛකොට සලකන්නේ නම් ඔහු විදේශ රටක පුරවැසිභාවය ලබාගනීද?

එමෙන්ම එවැන්නෙකුට ඕනෑම වැරදි තීරණයක් ගෙන ඊළඟ මොහොතේ රට අතහැර යා නොහැකි වන්නේද? යම් විදේශගත පුරවැසිභාවය ලබාගත් කෙනෙකු රට වෙනුවෙන් නැවත එය අත්හරින්නේ නම් එය පිළිගත යුතුය, අගය කළ යුතුය. ඒ අර්ථයෙන් වත්මන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාත් පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ මහත්මියත් සිය විදේශ පුරවැසිභාවය අතහැර ශ්‍රී ලංකික ජනතාවට සේවය කිරීමට කරන ලද තීන්දුවට අප ගරු කළ යුතුය.

යම් හෙයකින් විදේශ පුරවැසිභාවය සහිත පුද්ගලයෙකු රාජ්‍ය නායකයෙකු ලෙස හෝ අමාත්‍යවරයෙකු ලෙස රටවල් දෙක අතර වන ගනුදෙනුවකදී ශ්‍රී ලංකාවේ අභිලාශය අනුව කටයුතු කරනු ඇතැයි අපට දිය හැකි තහවුරුව කුමක් ද?

එමෙන්ම එවැනි ගනුදෙනුවකදී අදාළ රට අපගේ මහජන නියෝජිතයාට අදාල ගිවිසුම තම රටට වාසිදායක ලෙස සකස් කිරීමට බලපෑම් නොකරාවි යැයි

දිය හැකි සහතිකය කුමක් ද? මාගේ පෞද්ගලික අදහස නම් මහජන නියෝජිතයන් පමණක්

නොව, රට වෙනුවෙන් ප්‍රතිපත්ති තීරණ ගනු ලබන තනතුරු දරන කිසිදු මාණ්ඩලික නිලධාරියෙකුද විදේශගත පුරවැසියෙකු නොවිය යුතු බවය. එබැවින් මේ පිළිබඳව මන්ත්‍රීතුමන්ලා නැවත සලකා බැලිය යුතුව ඇත.

4. අමාත්‍ය මණ්ඩලයේ සීමාව ඉවත් කිරීම.

ශ්‍රී ලංකාවේ ජනගහනයට සාපේක්ෂව මහජන නියෝජිතයන්ගේ ප්‍රමාණය වැඩි බව නිරන්තරයෙන් සමාජ කතිකාවට එන මාතෘකාවකි. එමෙන්ම සමහර මහජන නියෝජිතයන්ගේ ක්‍රියාකාරීත්වය මත ඔවුන් කෙරෙහි මහජන අප්‍රසාදයක්ද ගොඩනැගී ඇත. එයින් සමස්ත මහජන නියෝජිතයන් ¥ෂිත හෝ නුසුදුස්සන් නොවුවද, අමාත්‍ය මණ්ඩලය වැඩි කිරීම ජනතා ප්‍රසාදයට හේතු නොවන්නකි. 19 වන ව්‍යවස්ථාව සම්මත කළ පසුගිය ආණ්ඩුව අමාත්‍යධුර සංඛ්‍යාව සීමා කර පසුව නීතියෙන් රිංගා යමින් අමාත්‍යධුර ප්‍රමාණය වැඩි කර ගැනීම මහජන අප්‍රසාදයට හේතු විය. එමෙන්ම වත්මන් ජනාධිපතිතුමන් අමාත්‍ය මණ්ඩලය 30 සීමා කරන බවට ප්‍රතිඥා දී ඇති වටපිටාවක එම සීමාව ඉවත් කිරීමට යෝජනා කිරීම ආණ්ඩුව අප්‍රසාදයට ලක්කර ගැනීමකි.

5. වසරක් අවසාන වීමෙන් පසු පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට ජනාධිපතිවරයාට බලය ලැබීම.

ලංකාවේ පාලන ක්‍රමවේදය අනුව, වෙන් වෙන් වූ මැතිවරණ හරහා ඒ ඒ නියෝජිත ආයතන සඳහා නියෝජිතයන් පත්කර ගනු ලබන අතර ඒ අනුව ඒ ඒ අයතනයන්ට පැවරෙන නිශ්චිත වගකීම් ප්‍රමාණයක් වේ. එම නියෝජිත ආයතන අතර වඩා බලගතුම ආයතනය වන්නේ පාර්ලිමේන්තුවයි. ඒ ජනතාව වෙනුවෙන් ඔවුන්ට නීති සම්පාදනය කිරීමට ලැබී ඇති බලය හේතුවෙනි.

පසුගිය ජනාධිපතිවරණයේදී ජනතාව පැහැදිලි ජනවරමක් ලබා දෙමින් වලංගු ඡුන්ද 52% ලබා දෙමින් ජනාධිපතිවරයෙකු පත්කර ගත් අතර ඒ ජනාධිපති ධුරයේ කාර්යය ඉෂ්ඨ කර ගැනීම සඳහායි. පාර්ලිමේන්තු මැතිවරණයේදී එම ප්‍රතිශතයට වඩා වැඩි ජනවරමක් එනම් 59% ලබාදෙමින් ව්‍යවස්ථා සම්පාදනයට පිරිසක් පත්කරනු ලැබීය. එවැනි පරිසරයක් තුළ වැඩි මහජන පදනමක් සහිතව වසර පහක කාලයක් සඳහා ජනතාව තෝරාපත් කරගත් පාර්ලිමේන්තුව වසරක් තුළ විසුරුවා හැරීමට තනි පුද්ගලයෙකුට නැවත බලය ලබාදීම ප්‍රජාතන්ත්‍රවාදයේ කුමන මූලධර්මයට අනුකූලවේදැයි නොදනිමි. එමෙන්ම එය වත්මන් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට එකඟ විය හැකිදැයි හෘද සාක්ෂිය විමසිය යුතුය, එය පාර්ලිමේන්තු පරමාධිපත්‍ය නොසලකා හැරීමක් ද වනු ඇත.

6. පාර්ලිමේන්තු පනත් පිළිබඳව සොයාබැලීමට ජනතාවට ඇති කාලය අඩුකිරීම.

පාර්ලිමේන්තුවට පනතක් ගෙන ඒමේදී ගැසට් පත්‍රයේ පළකර දින 14 ක් ඒ සඳහා ලබාදෙන්නේ ජනතාවට එකී පනත කෙටුම්පත පිළිබඳව අධ්‍යනය කර අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම සඳහාය. එය දින හතකට සීමා කිරීම ජනතාවගේ අයිතිය සීමාකිරීමක් වේ. එමෙන්ම හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදනය නැවත ඇතුළත් කර ඇත. අපගේ අතීත අත්දැකීම් වනුයේ හදිසි පනත් ගෙන ඒමේ ප්‍රතිපාදන හරහා දේශපාලන අවශ්‍යතාවන් සපුරා ගැනීමකි. එය ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් නොවේ. පාර්ලිමේන්තුව කිසිවිටකත් ජනතාව ඔවුන්ට ලබාදුන් බලය හරහා ජනතාවගේ බලයට/අයිතියට සීමා නොපැනවීමට වග බලාගත යුතුය. ව්‍යවස්ථාදායක සභාවක් හරහා ක්‍රියාත්මක වූ ස්වාධීන කොමිෂන් සභා යාන්ත්‍රණය දේශපාලනීකරණය වීමද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඇතැම් බලතල කැබිනට් මණ්ඩලයට පවරා ගැනීමද නැවත සලකා බැලිය යුතු කරුණු අතර වේ.

20 ව්‍යවස්ථා සංශෝධනය පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීමට පෙර මේ පිළිබඳව විධිමත් හැදෑරීමක් කරන ලෙස අප මන්ත්‍රීතුමන්ලාගෙන් අපේක්ෂා කරමු. එමෙන්ම මෙවැනි තීරණාත්මක සංශෝධනවලදී මන්ත්‍රීවරුන් හට හෘදසාක්ෂියට එකඟව ඡුන්දය භාවිත කිරීම සඳහා රහස් ඡුන්දයක් ක්‍රියාත්මක කළ හැකි නම් වඩා යෝග්‍ය වනු ඇත.

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂ
පැෆ්රල් සංවිධානය



(https://www.sampath.lk/en/sampath-credit-card-offers/daraz-offer-27-10-2020)

## අද දිවයින (/daily/index.php/puwath)

රවිට ඇලෝසියස්ට අල්ලස් කොමිසමෙන් නඩු - අධිචෝදනා 6